දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 2135411

E-Mail – cgir@ird.gov.lk
Web: www.ird.gov.lk

SEC/2023/E/02 **2023.04.06**

සේවා නියුක්තික ආදායම ගණනයේ දී ප්‍රතිලාභ සඳහා ඇතැම් මුදල් ප්‍රමාණයන් ප්‍රමාණනය කිරීම

සේවානියුක්තිකයෙකුගේ සේවානියුක්තිය මගින් වන ලැබීම් සහ ලාභ ප්‍රමාණනය කිරීම සම්බන්ධයෙන්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ අනුමැතිය සහිත, යොමු අංක FP/R/01/05/07/05-2023 දරන 2023.02.07 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කළ උපදෙස් මත සහ යොමු අංක FP/01/01/05/09-2022 දරන 2023.03.30 දිනැති ලිපිය අනුව භාණ්ඩාගාර ලේකම් වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කළ වෙනස්කම් මත පදනම්ව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

මෙම චක්‍රලේඛය 2023 අප්‍රේල් 01 වන දින සිට බලාත්මක වේ.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව, 2023 ජනවාරි 01 වන දිනෙන් ආරම්භ වන ඕනෑම මාසයක් සඳහා සේවා නියුක්තියක් මගින් ලැබෙන සේවා නියුක්තිකයෙකුගේ ලැබීම් සහ ලාභ ගණනය කිරීමේ දී එකී සේවා නියුක්තිකයා විසින් ලැබූ හෝ උපයන ලද ප්‍රතිලාභ ලෙස ඇතුළත් කළ යුතු මුදල් ප්‍රමාණ පහත පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබේ.

1. සේවායෝජකයා විසින් ප්‍රදානය කළ සමාගම් කොටස්වල වටිනාකම

ඕනෑම කොටසක් විභජනය කිරීමේ හෝ ඕනෑම කොටසක් අත්පත් කර ගැනීමට මනාපයක් ප්‍රදානය කිරීමෙන් සේවායෝජකයාගේ ඕනෑම සේවා නියුක්තිකයෙකුට උපචිත වන ඕනෑම ප්‍රතිලාභයක "වටිනාකම" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි සේවා නියුක්තිකයින් උදෙසා වූ යෝජනා ක්‍රමයක් යටතේ විභජනය කරන ලද කොටස්වල ඒ විභජනය කරන ලද අවස්ථාවේ වෙළඳපොළ වටිනාකමෙන් එම කොටස් සඳහා සේවා නියුක්තිකයාගේ දායක මුදල අඩු කළවිට, යම් අතිරික්තයක් තිබේ නම්, එම අගය අදහස් වේ.

2. සේවායෝජකයෙකු විසින් සපයන ලද ඕනෑම වාසස්ථානයකින් වන ප්‍රතිලාභවල වටිනාකම

(අ) සේවායෝජකයෙකු විසින් සපයනු ලබන යම් වාසස්ථානයක් සඳහා ප්‍රතිලාභයේ වටිනාකම, සළකනු ලබන අවස්ථාවන්හිදී, පහත නිශ්චය කර ඇති මුදල් ප්‍රමාණයන් විය යුතුය;

විස්තරය	අදාළ මාසය සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණය		
	පළාත් පාලන ආයතන මගින් වරිපනම් බදු එකතු කරනු ලබන වරිපනම් බදු සහිත ප්‍රදේශ	පළාත් පාලන ආයතන මගින් වරිපනම් බදු එකතු කරනු ලබන වරිපනම් බදු රහිත ප්‍රදේශ	වතු බංගලා
සේවායෝජකයා විසින් වාසස්ථානය (ගෘහභාණ්ඩ සහිත/ ගෘහභාණ්ඩ රහිත) සැපයීම	සළකනු ලබන සේවානියුක්තිකයාගේ අදාළ මාසයේ වැටුපෙන් 12.5% ක්	සළකනු ලබන සේවානියුක්තිකයාගේ අදාළ මාසයේ වැටුපෙන් 10 % ක්	සළකනු ලබන සේවානියුක්තිකයාගේ අදාළ මාසයේ වැටුපෙන් 7.5% ක්

මෙම චක්‍රලේඛයේ කාර්යය සඳහා, "**වැටුප**" යන්නෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (W &OP) හෝ අර්ථ සාධක අරමුදල සඳහා අඩු කිරීම සඳහා සැළකීමට අවශ්‍ය වන මුදල් ප්‍රමාණය අදහස් කරනු ලැබේ. වෙනත් අවස්ථාවන් සඳහා, " වැටුප" යනු අදාළ සේවා නියුක්තියෙන් එකී සේවා නියුක්තිකයාට මුදල් (දළ) ලෙස සේවා නියුක්තියෙන් ලැබෙන ලැබීම් සහ ලාභ වේ.

(ආ) ඉහත 2 (අ) යටතේ නිශ්චය කළ වටිනාකම, සේවායෝජකයා විසින් දරන ලද පිරිවැය හෝ වාසික ස්ථානයේ වෙළඳපළ වටිනාකම ඉක්මවා යන විටක, සේවා නියුක්තිකයාගේ එවැනි කාර්යයක් සඳහා ප්‍රතිලාභයේ වටිනාකම විය යුත්තේ එම අගයයන් දෙකෙන් අඩු අගයයි.

(ඇ) සේවා නියුක්තිකයා පදිංචිව සිටින නිවසක් හෝ මහල් නිවාසයක් සම්බන්ධයෙන් මාසික දීමනාවක් ලෙස සේවා නියුක්තිකයාට ගෙවූ යම් මුදලක් හෝ සේවා නියුක්තිකයා විසින් දරන ලද ඕනෑම වියදමක් සේවායෝජකයා විසින් ප්‍රතිපූරණය කිරීමේ දී ප්‍රතිලාභයේ වටිනාකම විය යුත්තේ සේවායෝජකයා විසින් ගෙවූ දීමනාව හෝ ප්‍රතිපූරණය කළ සත්‍ය වියදමයි.

(ඈ) වාසික ස්ථානයක් සැපයීම හෝ කුලියක් ලෙස සේවා නියුක්තිකයාගේ වැටුපෙන් යම් ප්‍රමාණයක් අඩු කර ඇත්නම්, සේවා නියුක්තික ප්‍රතිලාභය විය යුත්තේ, ඉහත 2 (අ), (ආ) හෝ (ඇ) යටතේ නිශ්චය කළ ප්‍රතිලාභයෙන් සේවා නියුක්තිකයාගේ වැටුපෙන් අඩු කළ ප්‍රමාණය, අඩු කළ පසු ලැබෙන අගයයි.

3. සේවායෝජකයා විසින් සපයන ගමන්, ප්‍රවාහන හෝ ආශ්‍රිත පහසුකම්වල ඇතුළත් ප්‍රතිලාභවල වටිනාකම ප්‍රමාණනය කිරීම

පෞද්ගලික පාවිච්චිය සඳහා අර්ධවශයෙන් භාවිතා කරන මෝටර් රථ සැපයීම මගින් හෝ එවැනි වාහනයක් සැපයීම වෙනුවෙන් ගෙවූ යම් දීමනාවල සමුච්චිතය [පහත (ආ) සහ (ඇ) ඡේද සඳහා] මගින් වන ප්‍රතිලාභයේ වටිනාකම පහත පරිදි ප්‍රමාණනය කරනු ලැබේ.

(අ) සේවායෝජකයා විසින් සැපයූ යම් මෝටර් රථයක පෞද්ගලික භාවිතය (අර්ධ ලෙස) මගින් වන ප්‍රතිලාභයේ වටිනාකම

මෝටර් රථයේ වර්ගය	අදාළ මාසය සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණය (රු.)		
	මෝටර් රථය	රියදුරු	ඉන්ධන
ඕනෑම මෝටර් රථයක්	20,000	10,000	20,000

(ආ) රජය විසින් ඒ වෙනුවෙන් නිකුත් කළ යම් චක්‍රලේඛයක්, විධිවිධානයක් හෝ රෙගුලාසියක් යටතේ, එකී සේවානියුක්තිකයාගේ නිල භාවිතය (සම්පූර්ණ හෝ අර්ධ ලෙස) සඳහා එකී සේවායෝජකයා විසින් වාහනයක් ලබා දිය යුතු හෝ වාහනයක් ලබාදීම වෙනුවෙන් මුදලක් ගෙවිය යුතු අවස්ථාවක, එකී සේවා නියුක්තිකයා විසින් හිමිකාරීත්වය දරන හෝ කුලියට ගත් වාහනය පාවිච්චි කිරීම සඳහා සේවා නියුක්තිකයාට යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා වන ප්‍රතිලාභයේ වටිනාකම, සේවායෝජකයා විසින් දරන ලද පිරිවැයෙන් 25% ක් විය යුතුය.

(ඇ) යම් සේවානියුක්තිකයෙකුට නිල භාවිතය සඳහා වාහනයක් (සම්පූර්ණ හෝ අර්ධ ලෙස) ලබා දිය යුතු අවස්ථාවක සහ රජය විසින් ඒ වෙනුවෙන් නිකුත් කළ යම් චක්‍රලේඛයක්, විධානයක් හෝ රෙගුලාසියක් යටතේ ඉන්ධන සඳහා ගෙවීමකට හිමිකම් ඇතිවිට, ඇතුළත් කළ යුතු ප්‍රතිලාභයේ වටිනාකම, එකී චක්‍රලේඛය, නියෝගය හෝ රෙගුලාසිය යටතේ සේවා නියුක්තිකයා හිමිකම් දරන ඉන්ධන ප්‍රමාණයේ 25% කට ආරෝපණය කළ යුතු පරිදි සේවායෝජකයා විසින් දරනු ලබන පිරිවැයේ එකී කොටස විය යුතුය.

(ඈ) අවස්ථාවෝචිත පරිදි ප්‍රාථමික සේවානියුක්තිය සහ/ හෝ ද්විතියික සේවානියුක්තිය මගින් වන එක් වාහනයක් සම්බන්ධයෙන් පමණක්, ප්‍රතිලාභයේ වටිනාකම ඉහත 3(අ) ඡේදයේ සපයා ඇති පරිදි ප්‍රමාණනය කළ යුතුය.

(ඉ) වාහන එකකට වඩා වැඩි සංඛ්‍යාවකට සේවානියුක්තිකයාට ඉන්ධන සපයනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි ප්‍රාථමික සේවානියුක්තිය සහ/ හෝ ද්විතියික සේවා නියුක්තිය මගින් වන එක් වාහනයක් සඳහා පමණක් 3(ඈ) ඡේදය අදාළ වේ.

(ඊ) සියලුම අතිරේක වාහනවල ඉන්ධන සහ වාහනය සඳහා සේවායෝජකයා/ සේවායෝජකයින් විසින් දරන ලද සමුච්චිත පිරිවැය, ඇතුළත් කළ යුතු ප්‍රතිලාභයේ වටිනාකම විය යුතුය. එකී අතිරේක වාහනය/වාහන පිරිවැය නිශ්චය කළ නොහැකි නම්, ඒ හා සමාන වර්ගයේ වාහනයක් [එම වර්ගයේම හෝ ආසන්න වශයෙන් ඒ හා සමාන ඝන සෙන්ටිමීටර් (CC) ප්‍රමාණයක ධාරිතාවයක් ඇති වාහනයක් ඇතුළත්ව] සඳහා මාසිකව ගෙවනු ලබන මෙහෙයුම් කල් බදු ගෙවීමක වෙළෙඳපළ වටිනාකම, මාසයක් සඳහා එවැනි ප්‍රතිලාභයේ වටිනාකම විය යුතුය.

(උ) සේවායෝජකයා විසින් සපයනු ලබන මෝටර්බයිසිකලයක් පෞද්ගලික භාවිතය (සම්පූර්ණ හෝ අර්ධ ලෙස) මගින් සේවානියුක්තිකයාට වන ප්‍රතිලාභයේ වටිනාකම –

i. එම මෝටර් බයිසිකලය එකී සේවායෝජකයාගේ ගිණුම මගින් සේවායෝජකයා විසින් ඉන්ධන සහිතව සපයා දෙනු ලබන විට, එකී මූල්‍යමය නොවන ප්‍රතිලාභය මසකට රු 5,000/- ක් විය යුතුය. (එන්ජින් ධාරිතාවය නොසළකා);

ii. එම මෝටර් බයිසිකලය සේවායෝජකයා විසින් ඉන්ධන රහිතව සපයා දෙනු ලබන විට, එකී මූල්‍යමය නොවන ප්‍රතිලාභය මසකට රු 3,000/- ක් විය යුතුය. (එන්ජින් ධාරිතාවය නොසළකා)

(ඌ) සේවායෝජකයා විසින් සපයනු ලබන මෝටර් වාහනයක් හෝ මෝටර් බයිසිකලය පෞද්ගලික භාවිතයෙන් වන ප්‍රතිලාභයේ වටිනාකම–

i. සේවායෝජකයා විසින් සපයා ඇති ක්ෂේත්‍ර රාජකාරි සඳහා භාවිතා කරන ඕනෑම මෝටර් රථයක, එහි භාවිතය පිළිබඳ නිවැරදි වාර්තා එකී සේවායෝජකයා විසින් නඩත්තු කරන අවස්ථාවන්හි දී කිලෝමීටරයක් සඳහා එවැනි මූල්‍යමය නොවන ප්‍රතිලාභය රු 25/- ක් (මෝටර් රථයේ එන්ජින් ධාරිතාව නොසළකමින්) විය යුතු වන අතර මසකට රු 20,000/- නොඉක්මවිය යුතුය;

ii. සේවායෝජකයා විසින් සපයා ඇති මෝටර් බයිසිකලයක, , එහි භාවිතය පිළිබඳ නිවැරදි වාර්තා එකී සේවායෝජකයා විසින් නඩත්තු කරන අවස්ථාවන්හි දී කිලෝමීටරයක් සඳහා එවැනි මූල්‍යමය නොවන ප්‍රතිලාභය රු 05/- ක් විය යුතුය. (එහි එන්ජින් ධාරිතාවය නොසළකමින්)

(එ) සේවානියුක්තිකයා විසින් හිමිකාරිත්වය දරන ඕනෑම මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් නඩත්තු කිරීම හෝ ඉන්ධන සම්බන්ධයෙන් යම් වියදමක් සේවායෝජකයා විසින් දරන්නේ නම් හෝ ප්‍රතිපූරණය කරන්නේ නම්,සේවානියුක්තිකයාට වන ප්‍රතිලාභයේ වටිනාකම යනු සත්‍ය වියදමයි.

ගමනාගමනය, ප්‍රවාහනය හෝ ඒ ආශ්‍රිත පහසුකම් සැපයීම සඳහා සේවානියුක්තිකයාගේ වැටුපෙන් යම් ප්‍රමාණයක් අඩු කරන්නේ නම්, සේවානියුක්තික ප්‍රතිලාභය වනුයේ, ඉහත 3(අ) (ආ) (ඈ) හෝ (ඊ) යටතේ නිශ්චය කර ඇති ප්‍රතිලාභයෙන් සේවා නියුක්තිකයාගේ වැටුපෙන් අඩු කළ ප්‍රමාණය අඩු කළ පසු ලැබෙන අගයයි.

4. සේවායෝජකයා විසින් සපයා ඇති සන්නිවේදන පහසුකම්වල වටිනාකම ප්‍රමාණනය කිරීම

රජය විසින් ඒ වෙනුවෙන් නිකුත් කළ ඕනෑම චක්‍රලේඛයක්, නියෝගයක් හෝ රෙගුලාසියක් යටතේ සන්නිවේදන පහසුකම් සඳහා ගෙවීමක් ලැබීමට යම් සේවානියුක්තිකයෙකු හිමිකම් ලැබීමකදී, එවැනි ගෙවීම් සඳහා සේවායෝජකයා විසින් දරන ලද පිරිවැයෙහි 25%ක්, එවැනි ගෙවීම් සඳහා සේවානියුක්තිකයාගේ ප්‍රතිලාභවල වටිනාකම විය යුතුය.

5. සහනදායී පොලී අනුපාත මත ණය

සේවානියුක්තිකයා හෝ සේවානියුක්තිකයා වෙනුවෙන් යම් බැංකුවක් හෝ මූල්‍යමය ආයතනයක් සේවානියුක්තිකයකුට ණයක් සපයන විටකදී සහ සේවායෝජකයා විසින් එකී ණය මත පොළී පිරිවැයෙහි පූර්ණ හෝ අර්ධ ගෙවීම පියවීමට හෝ දරාගැනීමට එකඟ වන විටකදී සහ එකී ප්‍රතිලාභය සේවායෝජකයාගේ සියළු සේවානියුක්තකයින් සඳහා කිසිදු වෙනස්කමකින් තොරව පවතින අවස්ථාවකදී සේවානියුක්තකයෙකුට ලැබුණු හෝ උද්ගත වුණු එවැනි ප්‍රතිලාභයේ වටිනාකම ශූන්‍ය විය යුතුය.

6. සේවානියුක්තිකයාගේ දුරකථන බිල්පත් ගෙවීම

සේවායෝජකයෙකු විසින් සේවානියුක්තිකයාගේ රාජකාරී සහ පෞද්ගලික අරමුණු වෙනුවෙන් භාවිතා කළ දුරකථන හෝ සන්නිවේදන බිල්පත් ගෙවීමකදී, එකී ප්‍රතිලාභයෙන් සේවානියුක්තිකයාට ලැබුණු හෝ උද්ගත වුණු එකී ප්‍රතිලාභයේ වටිනාකම, සේවායෝජකයා විසින් කරන ලද බිල්පත් ගෙවීම් මුදලින් 50% ක් විය යුතුය.

7. සේවායෝජකයා විසින් සපයා ඇති වෙනත් මූල්‍ය නොවන ප්‍රතිලාභ

සේවායෝජකයා විසින් සපයන ලද වෙනත් සියළු මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහා දරනු ලැබූ වියදම, සේවා නියුක්තිකයා විසින් ලැබූ හෝ උපයන ලද ප්‍රතිලාභයක වටිනාකම ලෙස සැළකිය යුතුය. පිරිවැය නිශ්චය කළ නොහැකි නම්, සමාන ප්‍රතිලාභයක වෙළඳපොළ වටිනාකම, එකී ප්‍රතිලාභයේ වටිනාකම විය යුතුය.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

ඩී.ආර්.එස්. හපුආරච්චි
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත
කොළඹ 02.